# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,877/1 — 1969 ඔක්තෝබර් 24 වැනි සිකුරාදා — 1969.10.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. බී.—139/47

පී. සී. සී. අංකය ඒ. 744/50

**රේගු නිවේදනය (ආදයම් සංරක්ෂණ ආඥාව) අංක. 69/6**

**1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන වගන්තියෙන් තමා වෙත පවරනු ලැබූ බලතල අනුව මුදල් ඇමතිවරයා විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඇම්. රාජේන්ද්‍ර,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1969 ඔක්තෝබර් මස 22 වන දින,
කොළඹ, මුදල් අමාත්‍යාංශයේ දී ය.

**1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනත**

**ආඥාව**

මෙහි යා කොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් භාණ්ඩය සම්බන්ධයෙන් අපනයන තීරු ගාස්තු ප්‍රමාණය අඩු කිරීම සඳහා යෝජනාවක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු යැයි කැබිනට් මණ්ඩලය විසින් තීරණය කර ඇති හෙයින් ;

1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල අනුව, මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක, වන මම මෙහි යා කොට ඇති උපලේඛනයේ I වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II තීරයෙහි අනුරූප සටහනෙහි දක්වා ඇති අපනයන තීරු ගාස්තුව, 1969 ඔක්තෝබර් 31/නොවැම්බර් 1 වැනි දින මධ්‍යම රාත්‍රියෙහි සිට ගෙවන සේ ඉල්ලා සිටීමට හා අයකර ගැනීමට ප්‍රධාන රේගු අයකැමිට මේම ආඥාවෙන් නියම කරමි. එසේ ඉල්ලා අයකර ගත යුතු තීරු බදු රේගු ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ මේ භාණ්ඩය වෙනුවෙන් අයකර ගත යුතු හෝ ගෙවිය යුතු අපනයන තීරු බදුවල අතිරේකවශයෙන් විය යුතු ය.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1969 ඔක්තෝබර් මස 22 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය | |
|---|---|---|
| භාණ්ඩය | ප්‍රමාණය | රු. ශ. |
| ක්ෂණික තේ හා මෙහි පහත විස්තර කැරෙන පැකැට්ටුවල හා තේ පසුම්බිවල අසුරන ලද තේ හැර, අනෙකුත් ඕනෑම වර්ගයක තේ සඳහා ... ... ... ... ... | රාත්තල සියයකට | 39 00 |
| පැකැට්ටුවල හා තේ පසුම්බිවල අසුරන ලද තේ : කඩදාසි හෝ ඇළුමිනියම් පත්‍රවලින් ඇතුළත දවටනයක් ඇතිව අසුරන ලද තේ— | | |
| (අ) පිටත දවටනයක් හෝ පොලිතීන් කවරයක් හා මුද්‍රිත ලේබලයක් සහිතව ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (ආ) කුඩා බෙලෙක් පෙට්ටියක බහාලන ලද ... ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (ඇ) කඩදාසි කාටනයක බහාලන ලද ... ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (ඈ) ලී පෙට්ටියක බහාලන ලද ... ... ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (ඉ) පන් පෙට්ටියක බහාලන ලද ... ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (ඊ) දෙකෙළවර පමණක් මුද්‍රා සහිත පැකට්ටුවක බහාලන ලද ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| (උ) (පිටත) කඩදාසියෙන් පැකට්ටුව සම්පූර්ණ ලෙස ආවරණය නොකරණ ලද ... | රාත්තලකට ... | 0 24 බැගින් |

1 A ජේ 7796—12,400 (10/69)

| i වැනි තීරය<br>භාණ්ඩය | ii වැනි තීරය<br>ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| කෙළවර මුද්‍රා සහිතව කුඩා බෙලෙක් පෙට්ටියක හෝ පැකට්ටුවක අසුරන ලද තේ ... ... | රාත්තලකට ... 0 24 බැගින් |
| ආස්තරණය කළ ඇළුමිනියම් පත්‍රයක එනම්, කඩදාසිය ඇළුමිනියම් පත්‍රයෙන් වෙන්ව තිබෙනු වෙනුවට කඩදාසිය එම පත්‍රයටම අලවන ලදුව අසුරන ලද තේ ... ... ... ... | රාත්තලකට ... 0 24 බැගින් |

" ලංකාවේ අසුරන ලද පිරිසිදු ලංකා තේ " යන වචන හෝ ප්‍රධාන රේගු අයකැමිගේ අදහස පරිදි මේ අර්ථයම ගෙන දෙන වෙනත් වචන බෙලෙක් පෙට්ටියේ හෝ කාටනයේ හෝ පිට කවරයේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

පැකට්ටුවක තිබිය යුතු තේ ප්‍රමාණයෙහි ශුද්ධ බර රා. 2.20 ක් හෝ කිලෝ ග්‍රෑම් 1 කට වැඩි නොවිය යුතු ය.

| | |
|---|---|
| පසුම්බිය ජලයෙහි ගිල්වා පානය සඳහා සකස් කර ගන්නා තේ සහිත පෙරන කඩදාසි හෝ පෙරන රෙදි පසුම්බිවල අසුරන ලද තේ ... ... ... ... ... | රාත්තලකට ... 0 24 බැගින් |

තේ පසුම්බිය පිට කවරයක බහාලන ලද නම් එම කවරයේ " ලංකාවේ අසුරන ලද පිරිසිදු ලංකා තේ " යන වචන හෝ ප්‍රධාන රේගු අයකැමිගේ අදහස පරිදි මේ අර්ථයම ගෙන දෙන වෙනත් වචන පැහැදිලිව සඳහන් කළ යුතු ය.

තේ පසුම්බි කාටනයක බහා ඇති නම් එම් කාටනයේ ඇති පසුම්බි ගණන සහ එක් එක් පසුම්බියේ ඇති තේ ප්‍රමාණයේ ශුද්ධ බර කාටනයේ පිටත සඳහන් කළ යුතුය.

තේ පසුම්බියක තිබිය යුතු තේ ප්‍රමාණයේ ශුද්ධ බර අවුන්ස 12 කට හෝ ග්‍රෑම් 240 කට වැඩි නොවිය යුතු ය.

10—984

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.

සැ. යු.—